**අම්බලන්ගොඩ නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සඳහා වීථි පහන් නඩත්තුව සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.350,000 ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,992,722 ක් වූ තැන්පතු වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරිව තිබූ තොග අයිතම 33 කට අයත් ඒකක 2247 ක වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ මිළදී ගන්නා ලද රු.989,700 ක් වූ පරිගණක හා අමතර කොටස් පරිගණක හා උපාංග යටතේ ගිණුම්ගත නොකර, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 19 දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද අංක LL-6406 දරන ෆෙටෝන් ඩම් ට්‍රක් රථයේ වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(උ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් එවන ලද ශේෂ සනාථ සහතිකය අනුව රු.11,777,837 ක් වූ ගෙවිය යුතු පොලිය ද, කසල කළමනාකරණ සඳහා ලබාගත් රු.12,142,439 ක් වූ ණය මුදල ද ගිණුම්ගතකර නොතිබූ අතර ගලි රථය මිලදී ගැනීමට ලබාගත් ණය මුදල රු.32,392 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.333,157 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.375,000 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපලේඛන අනුව ශේෂයන් අතර රු. 5,645,559 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

වර්ෂ 04 කට වඩා වැඩි කාලයක සිට ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර ඇති රු.6,527,980 ක ශේෂ සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.35,480,168 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන කරන ලද තොග ලේඛනය හා ණය ලේඛනය සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්**

2014 පෙබරවාරි 13 දින පවත්වන ලද නගර ක්‍රීඩා උළෙල හා 2013 දෙසැම්බර් 12 සිට 15 යන දිනයන්හිදී බලප්‍රදේශයේ පදිංචි දරු දැරියන් වෙනුවෙන් අභ්‍යාස පොත් බෙදාදීමට 2014 අප්‍රේල් 01 දින පිළිවෙලින් රු.306,620 ක් සහ රු.1,854,675 ක් වැය කිරීමට සභා අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද නගර සභා ආඥා පනතේ 159(1)(ඊ) උප වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රු.271,050 ක් සහ රු. 44,097 ක් මෙම කාර්යයන් සඳහා සභා අරමුදලින් වැය කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.20,948,592 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.16,862,377 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 ට පෙර පැවති වාර්ෂික තක්සේරුවක් මත වරිපනම් බදු අය කිරීම් කර තිබුණි.

(ආ) විගණන දිනය වූ 2015 ජනවාරි 26 දිනට රු.50,000 ට වඩා වැඩි හිඟ ශේෂයන් පැවති වරිපනම් බදු ඒකක 26 කින් රු.2,451,754 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට රු.10,263,829 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතියද නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය ප්‍රකාරව දේපල තහනම් කිරීමේ ක්‍රියාමාර්ගය අනුගමනය කර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදුකුලී**

---------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල නගර සභාවට අයකර ගතයුතුව තිබූ රු.2,706,846 ක් වූ බදුකුලී නගර සභා ආඥා පනතේ 170(අ)1 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

2.2.3 **කඩ කාමර බදු**

-----------------

සභාවට අයත් කඩ කාමර බදුදීම සම්බන්ධව 2015 ජනවාරි 28 දින සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විගණන දිනට කඩ කාමර 106 කින් රු.1,092,541 ක බදුකුලී හිඟව තිබූ අතර, කඩ කාමර 44 කින් මාස 06 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවති බදු කුලිය රු.870,831 ක් විය. මෙම කඩ කාමර 44 න් 09 ක් මුද්‍රා තබා සභාවේ භාරයට ගෙන තිබුණද සභාව විසින් ඉතිරි කඩ කාමර 35 සම්බන්ධයෙන් බදු ගිවිසුමේ කොන්දේසි අංක 5:2:11 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) සභාවට අයත් බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණ කඩ කාමර 4 ක, පොදු වෙළඳ සංකීර්ණය (බිම් මහල) කඩ කාමර 5 ක සහ නව පොදු වෙළඳ සංකීර්ණය (බිම් මහල) කඩ කාමර 2 ක, බදු ගිවිසුම් වර්ෂ 05 ක් ඉක්ම වී තිබුණි.

(iii) පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සම්බන්ධයෙන් බදු ගිවිසුමේ කොන්දේසි අංක 06 සහ 07 පරිදි කටයුතු කර නොතිබුණි.

(iv) අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනය ඉදිරිපිට පැවති නගර සභා ආපන ශාලාව සඳහා විගණන දිනය වනවිට බදුකරුවන් තිදෙනෙකුගෙන් රු.94,460 ක බදු මුදලක් හිඟව පැවතුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**----------------**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල නගර සභාවට අයකර ගතයුතුව තිබූ රු.129,163 ක් වූ බලපත්‍ර ගාස්තු නගර සභා ආඥා පනතේ 170(අ)1 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 302,201 ක උසාවි දඩ හා රු. 48,043,398 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 නිෂ්ක්‍රීය වත්කම්**

------------------

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස දන්වා තිබුණ ද, සභා භූමිය තුළ ත්‍රී රෝද රථයක්, ට්‍රැක්ටරයක් සහ හෑන්ඩ් ට්‍රැක්ටරයක් විගණන දිනය වූ 2015 ජනවාරි 28 දින වනවිට ද අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**අයවැය පාලනය**

---------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය